# ශ්‍රී ලංකාවේ පොලීසිය අත් අඩංගුවට ගත් සසප සාමාජිකයා නිදහස් කරයි

**Sri Lankan police release arrested SEP member**

**සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව) විසිනි**
**2008 සැප්තැම්බර් 25**

ශ්‍රී ලංකාවේ පොලීසිය සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජික වේලුම්මයිලුම් කමල්දාසන් සහ ඔහුගේ මස්සිනා වන චන්ද්‍රලිංගම් ඉලන්චේලියන් අවසානයේ නිදහස් කර තිබේ. ඔවුන් නිදහස් කෙරුනේ අඟහරුවාදා මීගමුව මහේස්ත්‍රාත් අධිකරන කාර්යාලයේ දී ය.

ඔවුන් දෙදෙනා සැප්තැම්බර් 15 අත් අඩංගුවට ගත් දා පටන් මීගමුව පොලිස් ස්ථානයේ කුඩුවක් තුල නීති විරෝධී ලෙස රඳවා ගෙන සිටිනු ලැබ ඇත. ඔවුන් නිදහස් කිරීම සිදු කෙරුනේ, සසප විසින් ගෙන යන ලද අධිෂ්ඨානවත් උද්ඝෝෂනයකින් සහ *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* පාඨකයන් වෙතින් ශ්‍රී ලංකාවේ බලධාරින් වෙත ලැබුනු විරෝධතා ලිපිවලින් පසුව ය. සසප සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) කමල්දාසන්ගේ සහ ඉලන්චේලියන්ගේ නිදහස සහතික කරගනු වස් ශ්‍රී ලංකාවේ හා ජාත්‍යන්තර පරිමාන අපගේ ආධාරකරුවන්ගෙන් ලද සහයෝගය වෙනුවෙන් ඔවුන් වෙත සිය ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමු.

කමල්දාසන් සහ ඉලන්චේලියන් සඳුදා සවස 4ට -- ඔවුන් රඳවා ගැනීමෙන් සතියකට පසුව -- මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට පමුනුවන ලදි. පරීක්ෂන අවසන්ව ඇති බැවින් සහ "සැකකටයුතු ක්‍රියාකාරකම්" පිලිබඳ සාක්ෂ්‍ය කිසිවක් සොයා ගෙන නැති බැවින් ඔවුන් දෙදෙනා ම නිදහස් කරන බව පොලීසිය මහේස්ත්‍රාත්වරයාට පැවසී ය. "සැකකටයුතු ක්‍රියාකාරකම්" යන්නෙන් පොලීසිය අදහස් කරන්නේ, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට පවත්නා සබඳතා හෝ "ත්‍රස්තවාදී" ක්‍රියාවන්ට සම්බන්ධ වීම යි.

ඔවුන් දෙදෙනා එතරම් දිගු කලක් රඳවා ගෙන සිටියේ මන් ද යන්න හෝ බලධාරින් රැඳවියන් වෙනුවෙන් සසප කල නියෝජනයන් නැවත නැවතත් නොතකා සිටියේ මන් ද යන්න හෝ පිලිබඳ කිසිදු පැහැදිලි කිරීමක් කලේ නැත. කමල්දාසන්, ශ්‍රී ලංකාවේ යුද්ධයට පමනක් නොව එල්ටීටීඊයේ ධනේශ්වර ජාතිකවාදී වැඩපිලිවෙලට ද පවත්නා සිය විරුද්ධත්වය සම්බන්ධයෙන් බෙහෙවින් ප්‍රසිද්ධ සසපයේ දිගු කාලීන සාමාජිකයෙකි.

කමල්දාසන් සහ ඉලන්චේලියන් බස් රථයකින් කොලඹ බලා යාමට සූදානම්ව සිටිය දී මීගමුව පොලීසියේ කන්ඩායමක් විසින් ඔවුහු අත් අඩංගුවට ගන්නා ලදි. ඔවුන් සිය අනන්‍යතාව සහතික කරනු වස් අදාල පොලිස් ලියාපදංචි ලියකියවිලි ඉදිරිපත් කලත් එය නොතකා ඔවුන්ට බසයෙන් බැසීමට අන කල පොලීසිය ඔවුන් පොලිස් ස්ථානයට රැගෙන ගියේ ය. "තව දුර පරීක්ෂන" බලාපොරොත්තුවෙන් ඔවුහු දින නවයක් තිස්සේ කිසිදු චෝදනාවකින් තොරව රඳවා ගෙන සිටින ලදි.

ඔවුන්ගේ දිග්ගැසුනු රඳවා ගැනීම මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් විවෘතව ම උල්ලංඝනය කිරීමක් පමනක් නොව නීති විරෝධී ක්‍රියාවක් ද විය. චෝදනා නැතිව පුද්ගලයන් රඳවා ගැනීම සඳහා ආරක්ෂක හමුදාවන්ට පුලුල් බලතල ලබා දෙන රටේ රුදුරු හදිසි නීති විධිවිධාන යටතේ පවා, රැඳවියන්ට නිශ්චිත සීමිත අයිතීන් ඇතැයි සැලකේ. තමන් සතුව රඳවා ගැනීමේ නියෝගයක් ඇති බව පොලීසිය අවසානයේ කියාපෑ නමුත්, නීතිය මගින් ඉල්ලා සිටින පරිදි, එය කමල්දාසන්ට හා ඉලන්චේලියන්ට පෙන්වීමට අසමත්ව තිබුනි. එමෙන් ම සසප සහ පක්ෂයේ නීතිඥවරයා විසින් ඉල්ලා සිටි විට ද එය ඉදිරිපත් කිරීමට පොලීසිය අසමත් විය.

ජනාධිපති මහින්ද රාජපක්ෂ 2006 මැද දී රට යලි යුද්ධය තුලට ඇද දැමීමේ පටන් ආරක්ෂක හමුදාවෝ රටේ දෙමල සුලුතරයට එරෙහි සිය මර්දනය උත්සන්න කර තිබේ. දෙමල ජනයා විශාල වසයෙන් ජීවත් වන ප්‍රදේශවල අනන්‍යතා සෝදිසි කිරීම් සහ පොලිස් පීරීම් සාමාන්‍ය දෙයක් බවට පත්ව තිබේ. සිය ගනන් දෙමල ජනයා හදිසි නීති බලතල සහ ත්‍රස්ත විරෝධී නීති යටතේ චෝදනා නොමැතිව සති ගනන්, මාස ගනන් සහ සමහර විට වසර ගනන් හිතුවක්කාරී ලෙස රඳවා ගෙන සිටිනු ලැබේ.

කමල්දාසන් සහ ඉලන්චේලියන් පොලිස් කුඩුවේ රඳවා ගෙන සිටියේ චින්නයියා ගෝපාලන් සහ ජේසුදාසන්

අම්බාලන් යන තවත් දෙමල ජාතිකයන් දෙදෙනකු ද සමග ය. එදින ම මීගමුවේ දී අත් අඩංගුවට ගනු ලැබූ ඔවුන් දෙදෙනා ද "සැකකටයුතු ක්‍රියාකාරකම්වල" යෙදීමක් පිලිබඳව සොයා ගැනීමට පොලීසිය අසමත් වීමෙන් පසුව අගහරුවාද නිදහස් කරන ලදි.

කමල්දාසන්ට හා ඉලන්චේලියන්ට එරෙහිව කිසිදු සාක්ෂ්‍යයක් නොමැති බව පොලීසිය පසුව පිලිගැනීම එම රඳවා ගැනීම්වල පවත්නා හිතුවක්කාරී ස්වභාවය පැහැදිලිව ම අවධාරනය කරයි. විශාල වසයෙන් දිවයිනේ සිංහල බහුතරය තුලින් බඳවා ගැනුනු, වර්ගවාදී අගතීන් තුල ගැඹුරට ම ගිලී සිටින ආරක්ෂක හමුදාවෝ, සියලු දෙමල ජනයා සතුරන් ලෙස සලකති. සිය පක්ෂ සාමාජිකයා සහ ඔහුගේ ඥාතියා නිදහස් කරන ලෙස සසප කල ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින්, මීගමුව මූලස්ථාන පොලිස් පරීක්ෂක (එච්ක්‍යුඅයි) සෝමසිරි ලියනගේ හිටිවන ම මෙසේ පැවසී යː "මේ තත්වය තුල කවුද ත්‍රස්තවාදියා කවුද එහෙම නැත්තෙ කියලා අපි හරියට ම කියන්නෙ කොහොම ද? . . . සෑම දෙමල අයෙක් ගැනම සැක කරන්න අපට සිද්ධ වෙනවා. "

ආන්ඩුව සහ ආරක්ෂක හමුදාවෝ, වඩ වඩා, නීතියට පිටින් ක්‍රියා කරති. මානව හිමිකම් සංවිධාන පැහැර ගැනීම්," අතුරුදහන්වීම්" සහ ඝාතන සිද්ධීන් සිය ගනනක් පිලිබඳව වාර්තා කර තිබේ. ඒ සියලුම සිද්ධීන්වල දී ආරක්ෂක හමුදාවල අන යටතේ නැතහොත් ඒවායේ සහභාගිත්වය යටතේ ක්‍රියා කරන ඝාතක කල්ලිවල සම්බන්ධය පිලිබඳව සාක්ෂ්‍ය පවතී. මාධ්‍ය ද ඉලක්ක කෙරී තිබේ. ආන්ඩුව සම්බන්ධයෙන් විවේචනශීලී වන මාධ්‍යවේදීන් වඩ වඩා සංඛ්‍යාවක් රඳවා ගැනීමට, පැහැර ගැනීම්වලට හෝ ඝාතනයන්ට ලක්ව ඇත. මේ එකඳු සිද්ධියක් සම්බන්ධයෙන් වත් පොලීසියේ හෝ මිලිටරියේ සාමාජිකයකු වරදකරුවකු කරනු තබා ඔවුන්ට විරුද්ධව චෝදනා හෝ ඉදිරිපත් කෙරී වත් නැති තරම් ය.

කමල්දාසන් සසප සාමාජිකයෙක් ය යන්න පැවසීම නොතකා ඔහු අත් අඩංගුවේ තබා ගැනීමට මීගමුව පොලීසියට පැවති අධිෂ්ඨානය, පොලිස් මර්දනය උත්සන්න කෙරෙමින් පවතින බවට කෙරෙන අනතුරු ඇඟවීමකි. ආන්ඩුවට, එහි වර්ගවාදී යුද්ධයට හා දෙමල ජනයාට එරෙහි ක්‍රමානුකූල වෙනස්කම් කිරීමට පමනක් නොව, එල්ටීටීඊයේ බෙදුම්වාදී වැඩපිලිවෙලට හා අහිංසක සිංහල ජනයාට එරෙහි එහි ත්‍රස්ත ප්‍රහාරවලට ද විරුද්ධ දිගු කාලීන වාර්තාවක් සසප සතුව පවතී. එහි සප්‍රතිපත්තික ආස්ථානයේ ප්‍රතිඵලයක් ලෙස, සසප ශ්‍රී ලංකා රාජ්‍යයේ සහ එල්ටීටීඊයේ යන දෙපාර්ශ්වයේ ම මර්දනයට මුහුන දී තිබේ.

1998 දී, පක්ෂයේ ක්‍රියාමාර්ගය සඳහා උද්ඝෝෂන කිරීම හේතු කොට ගෙන කිලිනොච්චියේ සසප සාමාජිකයන් සිවු දෙනෙක් එල්ටීටීඊය විසින් අත් අඩංගුවට ගෙන රඳවා ගන්නා ලදි. ඔවුන් සති හතකට වැඩි කලක් තිස්සේ රඳවා ගන්නා ලද අතර ඔවුන් නිදහස් කරන ලෙස ඉල්ලමින් සසප සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය ගෙන ගිය සංකේන්ද්‍රිත ජාත්‍යන්තර උද්ඝෝෂනයට හිස නැමීමට අවසානයේ එල්ටීටීඊයට සිදු විය. 2003 දී, සටන් විරාමය සහ සාම සාකච්ඡා ආරම්භ කිරීමත් සමග ම, උතුරේ යාපන අර්ධද්වීපයට නුදුරින් පිහිටි කයිට්ස් දූපතේ එල්ටීටීඊ නායකයෝ සසප සාමාජිකයන්ට මරන තර්ජන එල්ල කලහ. ප්‍රාදේශීය ධීවර සමූපකාර සමිතියක තෝරා පත් වූ නායකත්වය වූ සසප එයින් ඉවත් කිරීමට එල්ටීටීඊය ප්‍රයත්න දැරී ය. සසප සාමාජිකයෙකුට ශාරීරිකව පහර දෙන ලදුව ඔහුට බරපතල තුවාල සිදු විය.

කමල්දාසන් සහ ඉලන්චේලියන් අත් අඩංගුවට ගැනීම, නිශ්චිතව ම, දෙමල ජනයාට, විශේෂයෙන් ම දිවයිනේ උතුරේ උත්සන්න කෙරී ඇති යුද ගැටුම් හේතු කොට ගෙන එම ප්‍රදේශවලින් පලා ඒමට බල කෙරී ඇති දෙමල ජනයාට, එරෙහි පුලුල් පොලිස් මර්දනයක කොටසකි. උතුරු පලාතේ සිට කොලඹ ඇතුලු බස්නාහිර පලාතට පැමින ඇති සියලු දෙමල ජනයා සංගනනයකට භාජන විය යුතු යැයි රාජපක්ෂ ආන්ඩුව මෑත දී නිවේදනය කර තිබේ. ජනාධිපතිගේ සොහොයුරා ද වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ," එල්ටීටීඊය මේ ප්‍රදේශවලට විනිවිදීම සඳහා එම ජනයා සමග මිශ්‍ර වී සිටින" බැවින්, මෑත දී පැමිනි සියලු දෙමල ජනයාගෙන් සිය ගම්බිම් බලා ආපසු යන මීට පෙර ඉල්ලා සිටියේ ය.

රාජපක්ෂ ආන්ඩුව ගැඹුරු වන දේශපාලන අර්බුදයකට මුහුන දී සිටී. එහි උත්සන්න කෙරුනු වර්ගවාදී ප්‍රචාරක ව්‍යාපාරය තිබිය දී ම, යුද්ධය ගැඹුරු ලෙස මහජන පිලිකුලට ලක්ව ඇත. ජනගහනයේ පුලුල් ස්ථර යුද්ධයේ ක්ෂනික මරන හා ව්‍යසනයට පමනක් නොව, එහි ආර්ථික බලපෑමට ද ලක්ව තිබේ. දැවැන්ත මිලිටරි වියදම්, තෙල් හා ආහාරවල නැගෙන ජාත්‍යන්තර මිල ගනන් සමග එක්ව, දැන් සියයට 30 වටා කැරකෙන පාලනය කල නොහැකි උද්ධමනයකට තුඩු දී ඇත.

කම්කරුවන්ගේ, ගොවීන්ගේ හා ශිෂ්‍යයන්ගේ වර්ජනවලට හා විරෝධතාවලට ආන්ඩුව ප්‍රතිචාර දක්වා ඇත්තේ ද එය දෙමල ජනයාට සලකන ආකාරයට ම ය. රාජපක්ෂ වැඩි වැටුප්, ආන්ඩුවේ ආධාර හෝ වැඩි දියුනු සේවාවන් ඉල්ලා සටන් වදින අය ද්‍රෝහීන් ලෙස සලකා ඇත්තේ, යුද ප්‍රයත්නයට වල කපන බවට ඔවුන්ට චෝදනා කරමිනි. සසප සාමාජික කමල්දාසන් රඳවා ගැනීම වනාහි, පොලිස්-රාජ්‍ය විධික්‍රම දෙමල සුලුතරයේ සිට සමස්තයක් ලෙස කම්කරු පන්තියට එරෙහිව පුලුල් කල හැකි ය සහ පුලුල් කෙරෙනු ඇත යන්න පිලිබඳ තියුනු අනතුරු ඇඟවීමකි.

සසප ඉදිරිදර්ශනය සහ ක්‍රියාමාර්ගය බැරෑරුම්ව අධ්‍යයනය කරන ලෙස අපගේ සියලු පාඨකයන්ගෙන් හා ආධාරකරුවන්ගෙන් අපි ඉල්ලා සිටිමු. වර්ගවාදයේ සියලු රූපාකාරයන්ට විරුද්ධ වන ජන වර්ගය හා භාෂාව නොතකා සමාජවාදය සඳහා අරගලය තුල කම්කරුවන් ඒකාබද්ධ කිරීමට උද්ඝෝෂනය කරන ශ්‍රී ලංකාවේ එක ම පක්ෂය අපි වෙමු. හදිසි නීති බලතල යටතේ රඳවා ගෙන සිටින සියලු රැඳවියන් වහාම නිදහස් කරන ලෙසත් එම ප්‍රජාතන්ත්‍ර විරෝධී විධිවිධාන අහෝසි කරන ලෙසත් අපි ඉල්ලා සිටිමු. යුද්ධය අවසන් කරනු වස්, දකුනු ආසියාව තුල හා ජාත්‍යන්තරව සමාජවාදය සඳහා අරගලය තුල, ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් වටා කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීමේ අරගලයේ කොටසක් ලෙස උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු ආරක්ෂක හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කරන ලෙස ද අපි ඉල්ලා සිටිමු.

© www.wsws.org